# සිතෙහි පහළවන අකුශල ගති

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ
භාවනා අංශය පිළිබඳ ආචාර්ය
**මීරිස්වත්තේ අභයරේවත හිමියන් විසිනි.**

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අනවරාග්‍ර සංසාරයෙහි ජරා මරණාදී අනේක දුක්ඛස්කන්ධයනට භාජනව සසර සැරිසරනා සත්ත්ව සමූහයා විසින් විඳිනු ලබන මහත්වූ දුක්ඛ රාශිය හා එම දුක්ඛයන්ගේ හේතු බෝධිදාම මූලයේදී අවබෝධ කර වදාළ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ප්‍රතීත්‍ය සමුත්පාද හා ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෙහිලා සිතෙහි පහළවන අකුශල ගති තුදුසක් වදාරණ ලදී. එම ධර්ම දුක් පිණිස පවතින හෙයින් දැන දුරු කිරීම සකල බුද්ධශ්‍රාවකයන් විසින් සිදුකළ යුතු වන්නේය.

## 1. අවිද්‍යාව නොහොත් මෝහය :

අරමුණෙහි යථා සවභාවය මුවහ කිරීම ලක්‍ෂණ කොට ඇති මෝහය අරමුණෙහි යථා සවභාවය වටහා ගැනීම වූ ප්‍රඥාවට (විද්‍යාවට) ප්‍රතිපක්‍ෂ ධර්මයකි.

වන ලැහැබක අවපසළොස්වක් දිනෙක මැදියම් රැයේ වැසි වලාකුළු ඇති අවස්ථාවෙක ගමන් ගන්නා පුරුෂයාට අංග සතරකින් යුතු අන්ධකාරය එළඹ ඇති හෙයින් ගමන් මාර්ගය හරිහැටි සොයාගන්නට අපහසුවේ. කිසිවක් හරිහැටි නොපෙනෙන නිසා නියම මාර්ගය සොයා ගන්නට නොලැබී මහත් පීඩාවන්ට ගොදුරු වන්නට සිදුවේ. එමෙන් පෙරලොවක් ගැන ද, පරලොවක් ගැන ද, මේ දෙකම ගැන ද, හේතුඵල දහම් ගැන ද නොවැටහෙන නිසා සත්ත්වයෝ පාපයෙහි යෙදී අපා දුකට පත්වෙති. එහෙයින් ඥාණවන්තයින් ඇසුරු කිරීමෙන් හා සතර සතිපට්ඨානයන් වැඩීමෙන් මෝහය දුරු කිරීමට උත්සාහ දැරිය යුතුයි.

## 2. අහිරිකය :

කාය දුශ්චරිතාදියෙහි පිළිකුල් නොවන ලජ්ජා නොවන ලක්‍ෂණයෙන් හෙබි අහිරිකය පුද්ගලයා විපතට පමුණුවයි.

මළ මූත්‍රාදිය ඇති තැනකට යාමට පවා මනුෂ්‍යයෝ අප්‍රියවෙති. දැකීමට ද අප්‍රියවෙති. නමුත් ගම්උෟරාට එසේ නැත. ඒවා ඇති තැන් සොය සොයා යාමට ගම්උෟරා කැමතියි. ජනයා ඉදිරියේදීම මිහිරි බොජුනක් අනුභව කරන්නා සේ අසූචි අනුභවයට ගම්උෟරා ඉතා කැමතිය. එපරිද්දෙන් ආත්මගෞරවය ගැන නොසලකා තමාගේ ආත්මගෞරවය කෙළෙසී යන්නේ යයි නොතකා ලජ්ජාවක් නොමැතිව මහජනයා ඉදිරියේදී ද සතුන් මැරීම්, මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම්, ආලිංගන නෘත්‍යාදී වෙනත් නොසරුප් දේ කිරීමට මිනිසාව පොළඹවන්නේ වැරද්දට ලජ්ජාව නැති අහිරිකය නිසාය. සිහි නුවණ මෙහෙයා මෙයින් දුරුවීමට දැනගත යුතුවේ.

## 3. අනොත්තප්පය :

කාය දුශ්චරිතාදියෙහි බිය නොවන ලක්‍ෂණයෙන් යුතු අනොත්තප්පය නම් වූ පාපයෙහි බිය නොවන, විපාකයෙහි බිය නොවන ගතිය නිසා මිනිසුන්ගෙන් ලොවට විපත් ගෙන දේ.

මිනිසා පහන් සිළුවේ ආලෝකයෙන් ප්‍රයෝජන ගන්නවා මිස එය ඇල්ලීමට නොයයි. අත දැවෙන බව දන්නා හෙයිනි. නමුත් පළඟැටියා පහන් සිළුවක් දුටු විට එයට පනී. තෙල් පහනෙහි ගැලී පිළිස්සී මරුමුවට පත්වේ. ඔහුට බියක් නොදැනුන නිසා එසේ විනාශයට පත්වන්නට සිදුවිය. එමෙන් මනුෂ්‍ය ඝාතනයෙහි, සත්ත්ව ඝාතනයෙහි, සොරකම් කිරීමෙහි, මිථ්‍යාචාරයෙහි මේ ආදී අකුශලයෙහි විපාකයන් පිළිබඳවත් මෙලොවදීම ලැබෙන රාජ දණ්ඩන වධ බන්ධන පිළිබඳවත් බියක් නොමැති පුද්ගලයා එම වැරදි සිදුකොට දෙලොවම විපතට පත්වේ. එහෙයින් නපුරු ක්‍රියාවන්හි විපාක දැන ඒවාට බියවී කටයුතු කිරීමෙන් තමාගේ ජීවත්වීම ද ලොවට පීඩාවක් නොවේ. ලජ්ජා බිය නැති පුද්ගලයාට නොකළ හැකි දරුණු පාපයක් නැත. මෙය ලෝක ධර්මය ද කඩ කිරීමකි. ආදීනව සලකා මෙය දුරු කිරීමට උත්සාහ දැරිය යුතුයි.

## 4. උද්ධච්චය :

නොසන්සුන් බව ලක්‍ෂණ කොට ඇති උද්ධච්චය අළු රැසකට ගල් කැටයක් දැමුවාක් මෙන් සිත්සතන් විසිරී එකමුතු බවින් තොරවී යන අකුශල ධර්මයකි. සිත්සතන් නොසන්සුන් පුද්ගලයාට එකමුතු බවකින් කටයුතු කළ නොහැකි වෙයි. එම සිතිවිල්ලට අනුව හැසිරීමෙන් බොහෝ වැරදි දැය සිදු කරයි. මෙලොව නින්දා අපහාසයන්, රාජ දණ්ඩනයන් ලබයි. පරලොව අපා දුකට ද පැමිණෙයි. එහෙයින් මෙහි සවභාවය සිහි නුවණින් සලකා සමාධි භාවනා සුවයෙන් දුරු කිරීමට හැකිවන බව දත යුතුයි.

## 5. ලෝභය :

අරමුණෙහි අතිශයින් ඇලීම ලක්‍ෂණ කොට ඇති ලෝභය සියලු දුක් විපත්වලට මුල්වෙයි.

උපක්‍රමයෙන් රිලා වඳුරු ආදී සතුන් අල්වා මරාගනු කැමති පුද්ගලයෝ එම සතුන්ගේ ගමන් මාර්ගවල ලහටු තැවරූ පුවරු දඬු තබති. සතුන් එහි පැමිණී විට අත් පා



5. මු.ස. 861064

හිස යන සථාන ලහවුවල ඇලී කිසිවක් කර කියාගත නොහෙන තත්ත්වයට පත්වෙති. ඒවා තැබූ මිනුෂ්‍යයෝ වහා පැමිණ දඬු මුගුරු ආදියෙන් පහර දී එම සතුන් මරා ගෙන යති. එපරිද්දෙන් ඇසට පෙනෙන දේවත්, කණට ඇසෙන දේවත්, නැහැයට ප්‍රිය ඇති සුවඳවත්, දිවට රසැති ආහාරයටත්, කයට පහසැති දෑයටත් ඕනෑවට වඩා ආශා කිරීමට සහ ඒවා ලංකර ගැනීමට කැමති පුද්ගලයා මේ පස්කම් සුවයට අසුචි මාරපාශයෙන් බැඳී බේරීමට මඟක් නැතිව මහත් ව්‍යසනයට පත්වේ. සංවරශීලී භාවය දියුණු කොට තැන්පත් සිතින් කරුණු වටහාගෙන ලෝභය දුරු කිරීම සහනයකි.

6. දිට්ඨිය :

කරුණු පිළිබඳ විපරීත සවභාවයෙන් (අයථා ලෙස) සිතීම ලක්‍ෂණකොට ඇති වැරදි අන්දමට වටහා ගැනීම වූ දිට්ඨිය යථා සවභාවය වටහා ගැනීම වූ සම්මා දිට්ඨි ඥාණ-යට ප්‍රතිපක්‍ෂ ධර්මයකි.

ඉන්ද්‍රජාලිකයෙක් (මැජික්කාරයෙක්) කැට කැබලිති ආදියෙන් රත්රුවන් මවාපාමින් ජනයා රවටන්නා සේද, ආරක්‍ෂාව පතා භූත නගරයකට ගිය පුද්ගලයා භූත භක්‍ෂණයට ගොදුරුවන්නා සේද හාත්පසින් වෙනස් ආකාරයක් ඇති කරවන මෙම දිට්ඨිය නිසා පාපයක් නැතැයි සලකා මිනුෂ්‍යයෝ සතුන් මරා කෑම, සුරාපානය කිරීම, පරපුරුෂ, පරස්ත්‍රී සේවනය කිරීම ආදී අසිරිත් කොට දෙලොවම පිරිහෙති වැනසෙති.

අඹ ගෙඩිය, දෙල් ගෙඩිය නොවන්නා සේ පාපය පිනක් නොවී හරි දැකීමෙන් තොරවූවෝ සතර අපායට පැමිණෙති. හරි දැකීමෙන් යුතු සදහම් දැන මෙයින් දුරුවීම මැනවි.

7. මානය :

උඩඟු බව ලක්‍ෂණ කොට ඇති මානය නිසා ද නොදැනුවත්වම බොහෝ පව් සිදුවේ.

ඉහළක එල්ලෙන ලෙළදෙන කොඩියක් මෙන් තමනුත් හැම තැනකට මොන ආකාරයකින් හෝ අනුන්ට වඩා කැපිපෙනෙනු රිසියෙන් කටයුතු කිරීමේ සවභාවය මානයයි. ශරීර ලක්‍ෂණය, තරුණකම, ධනවත්-කම, ජාතිය, ගෝත්‍රය, උගත්කම, ශිල්පවත්කම ආදී කරුණුවලින් එසේ සමාජයේ උසස් ලෙස පෙනී සිටීමට මෙම නම්බුකාර මානය සමත්වෙයි. තමාගේ කාලය, ධනය, ශ්‍රමය යොදා පටන්ගත් කුශලය මෙම අවගුණ-යෙන් පහත වැටීමට ඉඩ ඇති හෙයින් නිහතමානී ගුණය වඩා මානය දුරු කටයුතුයි.

8. දොසය නොහොත් කිපෙන ගතිය :

සැඩපරුෂ බව ලක්‍ෂ කොට ඇති ද්වේශය අති බිහිසුණු පාප ධර්මයකි.

රුක්බිලයක සැඟවී සිටිනා නාගයකු හට දඬු මුගුරු වලින් පහර දුන් විට නයා කිපී පහර දුන්නවුන් වෙත පැන දෂ්ට කර නසාලයි. එමෙන් සිතේ ඇතුළත පවත්නා මෙම දරුණු ද්වේශය නැඟී සිටි කල එම පුද්-ගලයා දයානුකම්පා විරහිතව සවකීය අයට පවා ද්‍රෝහී වීමෙන් විපත් පමුණුවයි. බිහිසුණු අපරාධකරුවෝ නමින් හැඳින්වෙන්නෝ මේ ද්වේශය අධික වූවෝය. තමාව විපතට පමුණුවන ද්වේශය මෛත්‍රී බලයෙන් සන්තුෂ්ටිය ඇති කරගෙන දුරු කටයුතුය.

9. ඉස්සා හෙවත් ඊර්ෂ්‍යාව :

අන් අයගේ සැප නුරුස්නා ගතිය ලක්‍ෂණ කොට ඇත්තේ ඊර්ෂ්‍යාවයි.

රූප ලක්‍ෂණයෙන් යුතු කෙනෙකු දැක අකමැතිවීම, දර්ශනීය මන්දිරවල වෙසෙන්නවුන් දැක අසතුටුවීම, සුව පහසු වාහනයක යනු දැක නොසතුටුවීම යනාදී අන් අයගේ විශේෂත්වයට සිතේ හටගන්නා මෙම ඊර්ෂ්‍යාව මෙලොවම තමන්ට පිරිහීම ගෙන දෙන්නකි. ලේ ධාතු පවා දූෂිත වෙයි. ඊර්ෂ්‍යා පරවශ මිනුෂ්‍යයෝ මරණින් පසු ප්‍රේතවැ උපන්නත් අනුන් දෙන පිං අනුමෝදනා වන්නට අසමත් වෙයි. මෙය භයානක රෝගයකැයි සලකා මුදිතා ගුණයෙන් දුරු කිරීමට දතයුතු වෙයි.

10. මච්ඡරිය හෙවත් මසුරුකම :

තමාගේ සැප සම්පත් සැඟවීම ලක්‍ෂණ කොට ඇත්තේ මසුරුකමයි.

තමා වෙහෙස මහන්සිවී හරි හම්බකරගත් වස්තු-වලට ආශා කිරීම සවභාව ගතියයි. එහෙත් තමා ළඟ වස්තු සම්පත් තිබියදී ඉල්ලාගෙන එන කෙනෙකු හට නැතැයි කීම හා එම වස්තු අන් අයට පෙනෙන්නට නොදී සැඟ-වීම මසුරු ගතියයි. එසේම සියයකින් පරිත්‍යාග කිරීමට හැකියාව තිබියදී පණසක් නම් ඇත යනාදියෙන් වසන් කිරීම ද මසුරුකමට අයත්ය. මේ ඊර්ෂ්‍යා මාත්ෂර්යය දෙකම ද්වේශයාගේ යහළුවෝය. කරුණා ගුණය වැඩී-මෙන් මෙය දුරු කටයුතු වෙයි.

11. කුක්කුච්චය හෙවත් පසුතැවීම :

සිතෙහි නැවත නැවත තැවීම ලක්‍ෂණ කොට ඇත්තේ කුකුස නොහොත් පසුතැවීමයි.

දාසකම් කරන්නා නිතරම තමාගේ අදහස් අනුව හැසිරීමට ඉඩ නොලබයි. තම සවාමියාගේ අණසකට නිතරම ගැතිව සිටිය යුතුවෙයි. එමෙන්ම කුකුස් ඇති වූ පුද්ගලයා ද තම තීරණයෙන් කුශල් කිරීමට නොහැකි තත්ත්වයට පත්වෙයි. නිතරම අතීතය ගැන සිත සිතා වෙහෙසට පත්වෙයි. හැකියාව තිබියදීත් පින්දහම් කෙළේ නැත යයි පසුතැවෙයි. බොහෝ සෙයින් පාපයන් සිදුකළා යයි පසුතැවීම කුක්කුච්චය නම් වෙයි. ඥාණ-වන්තයින් කරා එළඹ කරුණු පිළිවිසීමෙන් කුකුස් දුරු කර ගත හැකිය.

12. ථිනය හෙවත් සිතෙහි නිරුත්සාහය :

කුශල ධර්ම පිළිබඳ සිතේ නොඉවසීම් ලක්‍ෂණයෙන් පසුබටවීම ථිනයයි.

ගින්නට ළං කළ කුකුල් පිහාටුව හැකිලී යන සවභාවයෙන් යුක්තය. ථිනය නම් වූ සිතේ හැකිලීම ද

එබඳුය. සිත හකුළුවා තබා නිරුත්සාහී භාවයෙන් පුද්ගලයාව තබන මෙම ථිනය සිතේ ගිලන් බව වශයෙන් ද, අකර්මන්‍ය භාවය වශයෙන් ද දක්වෙයි. කුශලයන් පිළිබඳ කිසි ඕනෑකමක්, උත්සාහයක් නොදක්වා පුද්ගලයා කුශලයෙහි පමාකරවන මෙම අකුශල ගතිය, කුශලයන් පිළිබඳ යොමුකරවා උත්සාහය පමුණුවාලීමෙන් දුරු කටයුතු වෙයි.

### 13. මිඩය හෙවත් චෛතසිකයන්ගේ පසුබටවීම :

කටයුතු කුශලයන් පිළිබඳ චෛතසිකයන්ගේ නොහොත් අදහස්වලට නොඉවසීම් ලක්‍ෂණයෙන් පවත්නේ මිඩයයි. ගින්නට පානා ලද කුක්කුට පක්‍ෂ පත්‍රයකට උපමා ඇති මිඩය නම් වූ චෛතසිකයන්ගේ හැකිළීම ද පුද්ගලයා නිරුත්සාහි බවට පත් කිරීමට සමත්වේ. යහපත් ගති පහළ කර නොගන්නා ඔහු ජීවිතයට බාධා පමුණුවා ගනී. ථින, මිඩ දෙක චෛතසික වශයෙන් දෙකක් වුව ද ධ්‍යාන මාර්ගයනට බාධා පමුණුවන අවස්ථාවේ එකක් වශයෙන් ඉදිරිපත්වේ. දෙකින්ම යහපත් සිතුවිලි සඟවයි. නැවත නැවත යහපත් අදහස් මතුකර ගැනීමෙන් මෙය දුරුවෙයි.

### 14. විචිකිච්ඡාව නොහොත් සැකය :

අරමුණෙහි සැක කිරීම ලක්‍ෂණ කොට ඇත්තේ විචිකිච්ඡාවයි. පෙර කිසි දිනෙක නොගිය විරූ මාර්ගයක ගමන් කරන පුද්ගලයා දෙමංසන්ධියකට පැමිණ යා යුතු මාර්ගය තීරණය කර ගන්නට අසමත්වන්නා සේ විචිකිච්ඡාවට පත් පුද්ගලයාට ද අරමුණු විනිශ්චය කර ගන්නට නොහැකි වෙයි. තෙරුවන් කෙරෙහිත්, සීලාදිය කෙරෙහිත් සාංකා උපදවා ගනී. කරුණු පිළිබඳ හොඳහැටි විචාරණය කිරීමෙන් මෙය දුරුකට හැකි වන්නේය. මෙසේ සිත කිළිටි කරන මෙම පාප ධර්මයන් සමථ-විපස්සනා වඩා දුරු කිරීමට උත්සාහවත් විය යුතුයි.

**භික්‍ෂු පාරිශුද්ධියට හේතුවන උපොසථ විනය කර්මය**

— නිබ්බාණ පච්චයො හොතු —